මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: MF1/01/05/02/2025
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.09.04

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇති
සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ
අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් වෙත,

**<u>ඒකාබද්ධ සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2025</u>**
**<u>සංවර්ධන නිලධාරි සේවය / කළමනාකරණ සේවා නිලධාරි සේවය / රියදුරු සේවය / කාර්යාල සේවක සේවය</u>**

2025 වර්ෂය සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම අනුමතකර ඇති අතර එම ස්ථාන මාරු උපලේඛන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පලකර ඇත.

02. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධව අභියාචනා වෙතොත්, රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01)හි XVIII පරිච්ඡේදයේ 253(V) උපවගන්තිය ප්‍රකාරව අංක 15 පරිශිෂ්ටයේ දක්වා ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අභියාචනා 2024.09.15 දින හෝ ඊට පෙර මා වෙත එවීමට කටයුතු කළ යුතු අතර එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකාබැලීමට නොහැකි බව සියලුම නිලධාරීන් වෙත දැනුම් දීමට ද කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. (එම ආකෘතියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

03. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත හා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම්කරන ලද නිලධාරීන්ගේ නාමලේඛන ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකොට ඇත. ඒකාබද්ධ සේවයේ 2025 වාර්ෂික ස්ථාන මාරු ලේඛනය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකිරීමෙන් අනතුරුව එම දෙපාර්තමේන්තු වෙත ඉල්ලුම් කළ නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදී ඇත්ද යන්න පරීක්ෂාකර බලන ලෙසත්, ලබාදී නොමැති නම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අභියාචනා යොමුකරන ලෙසත් ඔවුන් දැනුවත් කරන මෙන් තවදුරටත් දන්වමි.

04. විවෘත / සීමිත තරඟ විභාග ප්‍රතිඵල මත කළමනාකරණ සේවා නිලධාරී සේවයට බඳවාගත් නිලධාරීන්ගේ පරිවාස කාලය / වැඩබැලීමේ කාලය සම්පූර්ණවීමට පෙර මෙම අමාත්‍යාංශයට ස්ථාන මාරු ලබා ඇත්නම් එම පරිවාස කාලය / වැඩබැලීමේ කාලය සම්පූර්ණ වන දිනය මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය ලෙස සැලකේ. ඒ සම්බන්ධයෙන් එවැනි නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ එම නිලධාරීන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනයේ හෝ අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකර ඇති උපලේඛනවල සඳහන් අනෙකුත් තොරතුරුවල හෝ කිසියම් වෙනසක් සිදුකළ යුතු නම් ඒ බව සනාථ කරගත හැකි ලියවිලිද සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් ලිඛිතව මා වෙත දැන්වීමට කටයුතු කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ලේකම් වෙනුවට